www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ආකර කම්කරු සමිතිය සහ කලු පෙනහලු රෝගය යලි ඉස්මතු වීම

## The United Mine Workers of America and the resurgence of black lung disease

2010 ජනවාරි 12

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිලිබඳ ජාතික ආයතනය (එන්අයිඕඑස්එච්) ට අනුව මෑත වසරවල දී එක්සත් ජනපද ආකර කම්කරුවන් අතර කලු පෙනහලු රෝගී සංඛ්‍යාව දෙගුනයකට වඩා වැඩි වී තිබේ. මෙමගින් පෙනහලු පටක විනාශ කොට ආකර කම්කරුවන් ක්‍රමක්‍රමයෙන් මරනය කරා මිරිකා හරින කලු පෙනහලු හෙවත් ආකර කම්කරු (pneumoconiosis) නියුමොකොනියෝසියාව සියයට 90කින් පමන අඩුවෙමින් දශක ගනනාවක් පුරා පැවති රැල්ල ආපසු හැරවේ.

කලු පෙනහලු රෝගය යලි ඉස්මතු වීම පෙන්නුම් කරන්නේ ආකර කම්කරුවන් පමනක් නොව සමස්ත කම්කරු පන්තිය ම ලබාගත් ඓතිහාසික ජයග්‍රහනයන් සියල්ල ආපසු හරවන ඛේදනීය ස්වභාවය යි. 1960 සහ 1970 ගනන්වල තම වැඩ සහ ජීවන කොන්දේසි ඉහල දමාගැනීම සඳහා ආකර කම්කරුවන් නිරතවූ මහජන අරගලවලට පෙර කලු පෙනහලු රෝගය පැතිරී පැවතුනේ 1962 පලකල මයිකල් හැරින්ටන්ගේ සුප්‍රකට අනෙක් ඇමරිකාව (*The Other America.* දි අදර් ඇමරිකා) කෘතියේ වාර්තා කල පරිදි විශේෂයෙන් ම ඇපලාෂියාහි ආකර ප්‍රදේශ ද ඇතුලත්ව ජනගහනයේ පුලුල් ස්ථර මර්දනයට ලක්කිරීම සහ දරිද්‍රතාව හේතුවෙනි.

1950 වසරේ 500,000තට ආසන්න ආකර කම්කරුවන් ගනන අද වනවිට 98,000ක පමන යෝධ ලෙස අඩු වී ඇතත් කලු පෙනහලු සිද්ධි ගනන සහ ඒවායේ අනුපාතය තරුන ආකර කම්කරුවන් ද ඇතුලත් කම්කරුවන් අතර වැඩිවෙමින් තිබේ. සෞඛ්‍ය නිලධාරීහු මෙම වැඩිවීමට හේතු ලෙස දක්වන්නේ 1978 පටන් සියයට 32කටත් වඩා වැඩි කොට ඇති දීර්ඝ වැඩ පැය ගනන් සහ වඩ වඩා අඟුරු දූවිලිවලට නිරාවරනය වීම යි. මේවා විශාල වසයෙන් ලාභ-පිපාසිත සමාගම් පූර්වයෙන් කැනීම් අවසන් කල යයි සැලකුනු ස්ථානවලින් ගල් අඟුරු කැනීමට ධාවනයේ යෙදීමේ ප්‍රතිඵල වේ.

ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් යන පරිපාලනයන් දෙක ම යටතේ සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන්වල ක්‍රමානුකූල දුර්වල කිරීම ද මෙයට ප්‍රතිපදානය කොට ඇත. බුෂ් පරිපාලනය යටතේ හිටපු ආකර විධායක නිලධාරීන් ආකර ආරක්ෂක හා සෞඛ්‍ය පරිපාලනයේ (එම්එස්එච්ඒ) භාරකාරීත්වයට පත්කරන ලද අතර ගල් අඟුරු සමාගම්වලට ඔවුන්ගේ ම පොලිස් රාජකාරියේ යෙදීමට ඉඩදෙන ලදී.

1995 පටන් අඟුරු දූවිලිවලට නිරාවරනය වීම අඩකින් එනම් ඝන මීටරයකට මිලිග්‍රෑම් එක දක්වා අඩුකිරීමට එන්අයිඕඑස්එච් නිර්දේශ කොට ඇතත් එම්එස්එච්ඒ එලෙස නිශ්චිත සීමාවක් පැනවීම ප්‍රතික්ෂේප කොට තිබේ. කර්මාන්තයේ අවශ්‍යතා දකුනු ඉලිනොයිහි ගල් අඟුරු ආකර හිමිකරුවන් සමග දීර්ඝ කාලීනව සමීප සබඳතා ඇති ජනාධිපති ඔබාමා යටතේ නො නවත්වා රැකී පවතී.

කලු පෙනහලු රෝගය යලි ඉහල මට්ටම්වලට පැමිනීම සියල්ලට වඩා ඇමරිකානු එක්සත් ආකර කම්කරු සමිතියේ (යූඑම්ඩබ්ලිව්ඒ) ද්‍රෝහී භූමිකාව පිලිබඳ සාක්ෂියකි. පසුගිය දශක තුන පුරා ආකර කම්කරුවන්ගේ විරුද්ධතවය ක්‍රමානුකූලව කඩාකප්පල් කොට ඇති යූඑම්ඩබ්ලිව්ඒ සියවසකට අධික අරගලවලින් පූර්ව පරම්පරා දිනාගත් අයිතීන් විනාශ කිරීමට හාම්පුතුන් සහ ආන්ඩුව සමග පෙලගැසී ඇත.

වරෙක ඇමරිකාවේ වඩාත් සටන්කාමී සහ ප්‍රබලතම වෘත්තීය සමිතිය වූ යූඑම්ඩබ්ලිව්ඒහි පරිනාමය සමස්තයක් ලෙස වෘත්තීය සමිති මහ ව්‍යාපාරිකයේ සංගත සහායකයින් බවට පරිවර්තනය වීමේ දර්ශකයකි. එය වනාහි ලාභ ගරන පද්ධතියට, ජාතිකවාදයට සහ විශේෂයෙන් ම ඩිමොක්‍රටික් පක්ෂය ඇතුලු ධනේශ්වර පක්ෂවලට දෙන සහයෝගයේ පදනම මත කම්කරු ව්‍යාපාරයක් ගොඩනැගීමේ ඉදිරිදර්ශනයට දෙන ලද ඓතිහාසික විනිශ්චයකි.

ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිති සංගතයේ අනෙක් ඒවා මෙන් ම යූඑම්ඩබ්ලිව්ඒ ද 1970 ගනන්වල

ඇමරිකානු ධනවාදයේ අර්බුදයට ප්‍රතිචාර දැක්වූයේ පන්ති අරගලය ප්‍රතික්ෂේප කරමින් සහ ශ්‍රම වියදම් අඩුකොට ඔවුන්ගේ ජාත්‍යන්තර ප්‍රතිමල්ලවයන්ට එරෙහිව එක්සත් ජනපද සංගත වඩා තරගකාරී කිරීම සඳහා හාම්පුතුන් සමග පෙලගැසෙමිනි.

යූඑම්ඩබ්ලිව්ඒහි පරිහානියේ හැරුම් ලක්ෂ්‍යයක් වූයේ 1982 දී රිචඩ් ට්රැම්කා එහි සභාපති ලෙස පත්වීම යි. ආකර කම්කරුවන්ගේ පන්ති විඥාත සහයෝගීතාව සහ පසුගිය ශතවර්ෂයේ මුල් දශක දෙකේ ප්‍රබල "ආකර යුද්ධ" තුල සවිබල ගැන්වුනු සටන්කාමී අරගලවල පොහොසත් සම්ප්‍රදායන් ක්‍රමානුකූලව විනාශ කිරීමට ට්රැම්කා වැඩ කලේ ය.

ආකර කම්කරුවන්ගේ දීර්ඝකාලීන මූලධර්ම වූ "කොන්ත්‍රාත් එපා, වැඩ එපා" සහ වෘත්තීය සමිතිගත මෙන් ම සමිති රහිත නිෂ්පාදනය ද ඇනහිටවීම සඳහා ජාතික වැඩවර්ජන දියත්කිරීම යන ඒවා ආපසු හැරවූ ට්රැම්කා ව්‍යසනකාරී "තෝරාගත් වර්ජන" පිලිවෙත හඳුන්වා දුන්නේ ය. මෙය 1984-85 ඒටී මැසේ සහ 1989-90 පිට්සන් යන ප්‍රබල අරගල හුදකලා කොට පරාජය කිරීමට මගපෑදීය. ඒ අතර ම යූඑම්ඩබ්ලිව්ඒ නඩුවලට මුහුන දුන්, පහර කෑමට ලක්වූ සහ ඝාතනය පවා කෙරුනු සටන්කාමී කම්කරුවන්ව අතහැර දැමී ය.

1989 ජුනි මාසයේ දී ආකර කම්කරුවන්ගේ කෝපය ප්‍රාන්ත 11ක් පුරා ව්‍යාප්තවුනු 50,000ක් පමනවූ පිට්සන් ආකර කම්කරුවන්ගේ හදිසි වර්ජනය තුලින් පුපුරා ගියේ ය. *චාල්ස්ටන් ගැසට්* සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ට්රැම්කා, පිට්සන් මුරන්ඩු භාවය ආකරවලට "ස්ථාවරත්වය" ගෙන ඒමේ සමිතියේ උත්සාහයන්ට වලකපා ඇති බව කියමින් ගල් අඟුරු හාම්පුතුන්ට ආයාචනා කලේ ය.

යූඑම්ඩබ්ලිව්ඒ පරාජය කිරීමේ දී ගල් අඟුරු හිමියන් සහ ආන්ඩුව සාර්ථක වුවහොත් එය ආකර කම්කරුවන්ගේ වඩා රැඩිකල් ව්‍යාපාරයකට හේතු වනු ඇතැයි ට්රැම්කා අනතුරු ඇඟවීය. "එය නැවත පැමිනෙන විට වෘත්තීය සමිතියේ ස්වභාවය වෙනස් වනු ඇතැයි මා සිතනවා" යයි ට්රැම්කා කීවේ ය. "අසාධාරනය ඉවසීමේ එහි (වෘත්තීය සමිතියේ-පරිවර්තක) හැකියාව ඉතා අඩු අතර වැඩ නො කරන්නේ යයි අප දන්නා පද්ධතියක් සඳහා අපගේ නොතැනියාවක් නො පවතී."

සමිතිය නියෝජනය කරන්නේ යයි කියා පෑ ආකර කම්කරුවන්ගේ අවශ්‍යතාවන්ට අත්‍යන්තයෙන් හතුරු දේශපාලන හා ආර්ථික පර්යායක් වෙනුවෙන් සමාවට කරුනු කියමින් හා එය ආරක්ෂා කරමින් ගල් අඟුරු හාම්පුතුන් වෙනුවෙන් පොලිස්කාරයෙක් ලෙස යූඑම්ඩබ්ලිව්ඒ ක්‍රියාකල බව ට්රැම්කා මුලුමනින් ම පිලිගත්තේ ය.

තමන්ගේ ම වෘත්තීය සමිතිය විනාශ කිරීමේ දී සහ ආකර කම්කරුවන් යලි වහලුන් බවට පත් කිරීමේ දී සහයෝගී වීම වෙනුවෙන් හිටපු යූඑම්ඩබ්ලිව්ඒ සභාපතිවරයාට ලැබුනු ත්‍යාගය වූයේ ඔහු ඒඑෆ්එල්-සීඅයිඕ නායකත්වයට ආරෝහනය වීම යි. ඇත්ත වසයෙන් ම මෙහි දී ද ට්රැම්කා ලාභ පද්ධතිය සහ ඩිමොක්‍රටික් පක්ෂය වෙනුවෙන් නිදහසට කරුනු කියන්නේ ඔබාමා පරිපාලනය රැකියා, ජීවන කොන්දේසි, සෞඛ්‍යාරක්ෂන ප්‍රතිලාභ සහ කම්කරු පන්තියේ සමාජ ජයග්‍රහන මත කෝපාවිෂ්ටව ප්‍රහාර එල්ල කරද්දී පවා එය සමග වෙන කවරදාටත් වඩා සමීපව ක්‍රියා කරමිනි.

සෞඛ්‍යය සහ ආරක්ෂාව යන කරුනු ආකර කම්කරු අරගලවල දී සෑම විට ම කේන්ද්‍රීයව පැවතී ඇත. 1968 දී වෙස්ට් වර්ජිනියාහි ෆාමින්ටන්හි දී ආකර පුපුරා යාමකින් කම්කරුවන් 78ක් ඝාතනය වූ විට ආකර කම්කරුවෝ කැරලි ගැසූ අවස්ථාවේ යූඑම්ඩබ්ලිව්ඒ සභාපති ටෝනි බොයිල් ආකර හාම්පුතුන් ආරක්ෂා කිරීමට ඉදිරිපත් විය.

මෙම කාලපරිච්ඡේදය තුල සාමාන්‍ය ආකර කම්කරුවෝ අනුග්‍රහශීලී වෛද්‍ය වෘත්තිකයන්ගේ ද ආධාර සහිතව ඒ වනවිට මධ්‍යම ආන්ඩුව විසින් වෘත්තීයමය රෝගයක් ලෙස පිලිගෙන පවා නො තිබුනු කලු පෙනහලු රෝගයේ කොන්දේසි සඳහා සහනාධාරයක් ඉල්ලා සිටීමට කලු පෙනහලු සංවිධානය දියත් කලහ.

1969 පෙබරවාරියේ වෙස්ට් වර්ජිනියාහි ආකර කම්කරුවෝ දින 23ක හදිසි වර්ජනයක් දියත් කොට එක්සත් ජනපදය තුල කලු පෙනහලු පිලිබඳ ප්‍රථම ව්‍යවස්ථාව පැනවීමට බලකලහ. මෙයට පසුව අනෙකුත් නීතිවලට අමතරව ආරක්ෂක පරීක්ෂන බලාත්මක කල සහ අඟුරු දූමාරයේ ප්‍රමානය මත නෛතික සීමා පැනවූ ආකර ආරක්ෂක හා සෞඛ්‍යය පිලිබඳ පනත සම්මත විය.

මෙම අරගලය යූඑම්ඩබ්ලිව්ඒ නිලධරයේ බියගුලුකම සහ ද්‍රෝහීත්වය මධ්‍යයේ පවා ආකර කම්කරුවන් සැලිකිය යුතු වර්ධනයන් දිනාගත් 1970 ගනන්වල යෝධ වර්ජන රැල්ල පෙරටු කොට පැමිනියේ ය. එයට ඩිමොක්‍රටික් ජනාධිපති ජිමී කාටර් විසින් පනවන ලද හොරිකඩ ටාෆ්ට්-හාට්ලි තහනම් නියෝගය කම්කරුවන් විසින් විවෘතව විරෝධයට ලක්කල 1977-78 දින 111 වර්ජනය ද ඇතුලත් ය.

යූඑම්ඩබ්ලිව්ඒහි සම්පූර්න සහයෝගය සහිතව 1960 සහ 1980 අතර කාලයේ දිනාගත් සැලකිය යුතු ජයග්‍රහන

ආපසු හරවනු ලැබ ඇත. යලි වතාවක් ඇපලාෂියාහි නිම්න සහ ආකර නගර ප්‍රදේශ ඉහල දරිද්‍රතාව සහ විරැකියා අනුපාතයන්ගෙන් පලුදු වී ගොස් ඇත්තේ වෙස්ට්වර්ජිනියාහි සාමාන්‍ය පවුලක ආදායම අනවරතව සියලු එක්සත් ජනපද ප්‍රාන්තයන් අතුරින් පතුලේ හෝ ඒ ආසන්නයේ පවතින තතු යටතේ ය. තරුන කම්කරුවෝ අනාරක්ෂිත, අපිරිසිදු "ආවාටමය" පතල්වල වැඩකිරීමේ, වෙනත් තැනක රැකියාවක් පතා ප්‍රාන්තය හැරයාමේ හෝ මිලිටරියට බැඳීමේ මුස්පේත්තු තේරීම් අතරින් එකක් ගනිමින් ඔවුන්ගේ ජීවිතය ඔවුන් අතට ම ගනිති.

කලු පෙනහලු රෝගය ඉහලයාම් වැඩිපුර ම වාර්තා වන්නේ පැරනි යූඑම්ඩබ්ලිව්ඒ බලකොටු වන පෙන්සිල්වේනියා, වෙස්ට් වර්ජිනියා, කෙන්ටකි සහ බටහිර වර්ජිනියා යන ප්‍රදේශවල යයි කියනු ලැබේ. වර්තමානයේ වැඩකරන ආකර කම්කරුවන්ගෙන් සියයට 15ක් යූඑම්ඩබ්ලිව්ඒ සාමාජිකත්වය දරන්නේ එහි හොඳම දවස්වල 1950 පැවති සියයට 90 මට්ටමින් පහලට වැටීගෙන ය. කීවේ යූඑම්ඩබ්ලිව්ඒහි ක්‍රියාකාරී සාමාජිකත්වය 1978 120,000ක ප්‍රමානයේ සිට දැනට 14,152කට ඇදවැටී ඇත.

ආකර කම්කරුවන් සහ සමස්ත කම්කරු පන්තිය අරගලයේ නව සංවිධාන සහ තමන්ව ම ආරක්ෂා වී ගැනීමට නව මාර්ග සොයනු ඇතැයි යන්න නොවැලැක්විය හැකි ය. මෙහි සාර්ථකත්වය රැඳී පවත්නේ ඇමරිකානු ධනවාදය සහ එය දිරිගන්වන ද්වි-පක්ෂ පද්ධතිය ආරක්ෂා කිරීම මත නොව ඒ වෙනුවට පවත්නා ආර්ථික හා දේශපාලන පද්ධතියට එරෙහි අශමනීය අරගලයක් මත පදනම් වන නව දේශපාලන ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීම මත ය. යල් පැනගිය සහ ප්‍රතිගාමී වෘත්තීය සමිති සංවිධානවලින් කැඩී ගතයුතු කම්කරු පන්තිය සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී මූලෝපායක් මත පදනම්ව සටන් වදින මහජන ව්‍යාපාරයක් නිර්මානය කල යුතු ය.

ජෙරී වයිට්

© www.wsws.org